# සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

## නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

# පුරප්පාඩු

**2008 අංක 35 දරන පනත යටතේ ස්ථාපිත කරන ලද සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**රැකියා විස්තරය :**

**2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ අධිකාරියට පැවරී ඇති කාර්යයන් ඉටුකිරීම**

## 1. කළමනාකරු (නීති) HM 1-1- තනතුරු 01

**පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - ප්‍රධාන කාර්යාලය (කොළඹ)**

**බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම:**

**සුදුසුකම් :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීති උපාධියක් සමග ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම. **සමග**

   තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් පිළිගත් පශ්චාත් උපාධියක් ලබා තිබීම. **සහ**

   රජයේ,රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස :** අවු.35ට නොඅඩු හා අවු.55ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** HM 1-1 : (රු.80,295 -15X2,270 - රු.114,345/=)

## 2. කළමනාකරු (පාලන හා මානව සම්පත් සංවර්ධන) HM 1-1- තනතුරු 01

**පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - ප්‍රධාන කාර්යාලය (කොළඹ)**

**බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම :**

**සුදුසුකම් :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය /රාජ්‍ය කළමනාකරණය/ රාජ්‍ය පරිපාලනය/වාණිජ්‍ය හෝ අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ වෙනත් උපාධියක් තිබීම. **සමඟ**

   තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම. **සහ**

   රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස :** අවු.35ට නොඅඩු හා අවු.55ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** HM 1-1 : (රු.80,295 - 15X2,270 - රු.114,345/=)

## 3. සහකාර/නියෝජ්‍ය කළමනාකරු (නීති) MM 1-1- තනතුරු 01

**පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - ප්‍රධාන කාර්යාලය (කොළඹ)**

**බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම:**

**සුදුසුකම් :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීති උපාධියක් සමග ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම. **සහ**

   නීතිඥවරයෙකු ලෙස වසර 01ක සේවා පළපුරුද්ද ලබා තිබීම.

**වයස :** අවු. 22ට නොඅඩු හා අවු.45ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** MM 1-1 : (රු.53,175-10X1,375-15X1,910 -95,575/=)

## 4. සහකාර/නියෝජ්‍ය කළමනාකරු (මූල්‍ය) MM 1-1- තනතුරු 01

**පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - ප්‍රධාන කාර්යාලය (කොළඹ)**

**බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම:**

**සුදුසුකම් : (පහත 1 හෝ 2)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වාණිජ්‍ය, ගණකාධිකරණය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, ව්‍යාපාර කළමනාකරණය, ගිණුම්කරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම. **සහ**

    උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබාතිබීම.

02 වාණිජ්‍ය, ගණකාධිකරණය, මූල්‍ය කළමනාකරණය, කළමනාකරණ ගිණුම්කරණය යන විෂය කේෂ්ත්‍රයක පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම සහ සුදුසුකම් ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස :** අවු. 22ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** MM 1-1 : (රු.53,175-10X1,375-15X1,910 -95,575/=)

## 5. තොරතුරු තාක්ෂණ නිලධාරී JM 1-2- තනතුරු 01

**පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - ප්‍රධාන කාර්යාලය (කොළඹ)**

**බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම:**

**සුදුසුකම් : (පහත 1 හෝ 2 හෝ 3 හෝ 4)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණික උපාධියක් ලබා තිබීම. **හෝ**
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම. **හෝ**
3. තනතුරට අදාළ විෂය කේෂ්ත්‍රයකින් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම. **සහ**

   සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම. **හෝ**
4. තනතුරට අදාළ විෂය කේෂ්ත්‍රයකින් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම. **සහ**

   සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ,රාජ්‍ය සංස්ථාවක මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහයක (10) පළපුරුද්දක් ලබා තිබීම.

**වයස :** අවු.22ට නොඅඩු හා අවු.45ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** JM 1-2 : (රු.43, 355-10X755-18X1,135-71,335/=)

## 6. සහකාර සමුද්‍ර පරිසර නිලධාරී MA 5-1- තනතුරු 10

**පුරප්පාඩු පවතින දිස්ත්‍රික්ක - ප්‍රධාන කාර්යාලය (කොළඹ), විද්‍යාගාරය (ගාල්ල), හම්බන්තොට, අම්පාර, ත්‍රිකුණාමලය, යාපනය, මන්නාරම, ගාල්ල, ගම්පහ**

**බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම:**

**අධ්‍යාපන සුදුසුකම්:**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිසර විද්‍යාව/ධීවර හා සාගර විද්‍යාව/ සමුද්‍රීය පරිසර කළමනාකරණය /පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය/කෘෂි විද්‍යාව/ව්‍යාහාරික විද්‍යාව/ජීව විද්‍යාව /සත්ව විද්‍යාව සහ ධීවර කටයුතු/ ස්වාභාවික විද්‍යාව/ ජෛව තාක්ෂණය/ ජලජ සම්පත් තාක්ෂණය/ රසායන විද්‍යාව/ භෞතික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් සමග අදාළ විෂය ක්ෂේත්‍රයෙන් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් තිබීම.

**වයස :** අවු. 22ට නොඅඩු හා අවු.45ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** MA 5-1: (රු.34,870 -10X660 -15X755 -11X930 - 63,025/=)

## 7. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) MA 1-2- තනතුරු 12

**පුරප්පාඩු පවතින දිස්ත්‍රික්ක - ප්‍රධාන කාර්යාලය (කොළඹ),කොළඹ, මඩකලපුව, යාපනය, කිලිනොච්චි, මන්නාරම**

**බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම :**

ලිඛිත තරඟ විභාගයක හා පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

**අධ්‍යාපන සුදුසුකම්:**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/ දෙමළ භාෂාව හා ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයන් 04 කට සම්මාන සාමාර්ථද ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක්ද සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් තුනක් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම.

**වෙනත් සුදුසුකම්:**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද මාස 06 කට නොඅඩු පරිගණක පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම හෝ ඊට සමාන වෙනත් සුදුසුකමක් ලබා තිබීම.

**වයස :** අවු.18ට නොඅඩු හා අවු.45ට නොවැඩි අය විය යුතු ය.

**වැටුප් පරිමාණය :** MA1-2 : (රු.27,910-10X300 - 7X350 - 12X600-12X710-49,080/=)

### පොදු:

**01. සෑම අයදුම්කරුවෙකුම,**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතු ය.

**02. සුදුසුකම් ලබන දිනය:**

සේවයට/තනතුරට පත්කිරීම සඳහා ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණි.

**03. පත්වීමේ ස්වභාවය:**

තනතුර ස්ථිරය. සේවක අර්ථසාධක අරමුදල (EPF) වෙනුවෙන් සේවකයා විසින් ගෙවනු ලබන 10% ට අමතරව අධිකාරියේ 15% ක දායකත්වයක් සහ සේවක භාරකාර අරමුදල (ETF) වෙනුවෙන් 3% ක අමතර දායකත්වයක් ලබාදෙනු ලැබේ.

**04. විභාග ගාස්තු:**

කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුර සඳහා අයදුම්කරන සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තු ලෙස රු.1,000/= ක මුදලක් මහජන බැංකුවේ දෙමටගොඩ ශාඛාවේ සභාපති, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ නමට වන සේ ගිණුම් අංක 071100180004783 ගිණුමට පමණක් බැර කළ යුතු වේ. අදාළ කුවිතාන්සියේ මුල් පිටපත අයදුම්පත සමග නොගැලවෙන සේ ඇළවිය යුතුය. කුමන හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

**05. අයදුම්පත්‍ර එවීම:**

1) අයදුම්කරුවන් තම අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක තනි පැත්තට සකස් කර මුල් පිටුවේ තම පෞද්ගලික විස්තරද, දෙවෙන පිටුවේ අධ්‍යාපන සුදුසුකම්ද, තෙවන පිටුවේ වෘත්තීය සුදුසුකම් සහ රැකියා පළපුරුද්ද ද, සිව්වන පිටුවේ බාහිර ක්‍රියාකාරකම්ද ඇතුළත් කර ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) නම් සහිතව අයදුම්පත්‍රය සකස් කරගත යුතුය.

2) කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරට අයදුම්කරන අයදුම්කරුවන් ලිඛිත විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (සිංහල/ දෙමළ) අයදුම්පතෙහි සඳහන් කිරීම අනිවාර්ය වේ

3) මෑතකදී ලබාගත් චරිත සහතික 2ක්, ග්‍රාම නිලධාරි සහතිකය, පොලිස් වාර්තාව, ජාතික හැඳුනුම්පත, සියලුම අධ්‍යාපන සහතික, වෙනත් සුදුසුකම් සනාථ කරන සහතිකවල සහතික කරන ලද ඡායාපිටපත් අමුණා සම්පූර්ණ කළ අයදුම්පත් 2024.04.04 වෙනිදට හෝ ඊට පෙර ලැබෙන පරිදි **සභාපති, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05** වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණය සඳහා ජාතික හැඳුනුම්පත සහ ඉහත ඡායා පිටපත් මගින් ඉදිරිපත් කරන ලද සහතිකයන්හි මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

4) තනතුරු කිහිපයකට අයදුම්කරන අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා අයදුම්පත් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.

5) රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය ආයතනවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් යොමු කළ යුතුය.

6) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, අදාළ සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා නොමැති හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.තැපැලෙන් අස්ථානගත වන අයදුම්පත් පිළිබඳ අප අධිකාරිය වගකියනු නොලැබේ.

**සභාපති,**
**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය**
**අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.**
**2024.03.22**